# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

பொலிஸ் ஊடகப் பிரிவு

POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120

ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 1517/2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2023

දිනය / திகதி / Date: 05/12/2023 පැය 0945

## මාධ්‍ය නිවේදනය

**01. අයිස් මත්ද්‍රව්‍ය සහ හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කුරුණෑගල කඳවුර.**

2023.12.04 වන දින රාත්‍රි කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කුරුණෑගල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත මැල්සිරිපුර පොලිස් වසමේ හිරියාල ලේනව ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 15 මිලිග්‍රෑම් 710 ක් , හෙරොයින් ග්‍රෑම් 01 මිලි ග්‍රෑම් 530 ක් සහ මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයාගන්නා බව සැක කරන මුදල් රුපියල් 11,000/= ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන මැල්සිරිපුර පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 37 ක් වන හිරියාල, ලේනව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** මැල්සිරිපුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. අයිස් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා වාලච්චේන කඳවුර.**

2023.12.04 වන දින රාත්‍රි කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා වාලච්චේන කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වාලච්චේන පොලිස් වසමේ නාවල්අඩි ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 09 මිලිග්‍රෑම් 90 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන වාලච්චේන පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 41 ක් වන වාලච්චේන ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** වාලච්චේන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. ගංජා හේනක් වටලා සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුත්තල කඳවුර.**

2023.12.04 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා බුත්තල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත තණමල්විල පොලිස් වසමේ

ඌරුහොර ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **ගංජා ගස් 1658 ක් වගාකර තිබූ හේනක් වටලා සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන බුත්තල පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30 ක් වන ඌවකුඩාඔය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** බුත්තල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. බලපත්‍ර නොමැතිව තේක්ක දැව ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මුලතිව් කඳවුර.**

2022.12.05 වන අද දින අළුයම් කාලයේදී පොලිස් විශේෂ කාර්ය බලකාය මුලතිව් කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත මුල්ලියාවේලි පොලිස් වසමේ වට්ටප්පලෙ ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර බලපත්‍ර නොමැතිව ට්‍රැක්ටර් රථයකින් තේක්ක දැව කඳන් 07 ක් ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු එම දැව හා ට්‍රැක්ටර් රථය සමඟ අත්අඩංගුවට ගෙන මුල්ලියාවේලි අඩවි වන කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 29 ක් වූ කෝප්පාපිලව්, මුල්ලියාවේලි ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

**05. මෙරට නිෂ්පාදිත ගිනි අවි දෙකක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා දඹුල්ල කඳවුර.**

2023.12.04 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා දඹුල්ල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත ගල්කිරියාගම පොලිස් වසමේ උස්සාන ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **මෙරට නිෂ්පාදිත ගිනි අවි දෙකක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන ගල්කිරියාගම පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 45 ක් වන උස්සාන, දේවහුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** ගල්කිරියාගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**